සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට පමණක්** උත්තර සපයන්න.

(ii) අංක 1 , 2 , 3 , 4 ප්‍රශ්නවලටත් 5,6,7, ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

(iii) මෙම පත්‍රය සඳහා නියමිත ලකුණු ගණන 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''තෝ කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් ද ?''

(අ) මෙසේ කීවේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය රචනා වූ යුගය ලියන්න.

(ii) බැඳි දන මන වැයුමෙහි ඇඳුරෝයා
විඳි සත්සර වෙණ සර මදුරෝයා
රැඳි සතොසින් සැනහුණු ඉඳුරෝයා
..........................................................................

(අ) මෙහි අවසාන පද්‍ය පේළිය ලියන්න.

(ආ) වෙණ සර යන්නෙහි අර්ථය ලියන්න.

(iii) ''... පුත මා විසින් කුමක් කළ මනා ද?...''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?

(ආ) මෙහි 'පුත 'යනුවෙන් ඇමතුම් ලැබුවේ කවුරුන් ද?

(iv) (අ) ගැමියා විවේකය දනුම්වත්කමින් හා විනෝදයෙන් ගත කිරීමට යොදා ගත් ජනකවි විශේෂය නම් කරන්න.

(ආ) ජාතික වීර කාව්‍යයක් බවට පත් වී තිබෙන එස්. මහින්ද හිමියන් විසින් රචිත කෘතිය කුමක් ද?

. (v) ''...එහෙයින් දූන් ඈට ද කොයි මග ගියත් එක ය ...''

(අ) මෙහි 'ඈ 'යනු කවරෙක් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතියේ අනුවර්තකයා නම් කරන්න.

(vi) (අ) ජපානයෙන් පිරිනමන ලද ස්වර්ණ රජත සම්මානයෙන් පිදුම් ලැබූ නිර්මාණකරුවා නම් කරන්න.

(ආ) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහයේ නම ලියන්න.

(vii) (අ) ''අඟුල්මල් දමනය'' අමාවතුර කෘතියේ කී වැනි පරිච්ඡේදයේ ඇතුළත් වේ ද ?

(ආ) ඡන්දස් ශාස්ත්‍රයට අදාළව අධ්‍යයනය කෙරෙන පැරණි සිංහල ග්‍රන්ථය කුමක් ද?

(viii) ''හිම සරි සිහිල් දිය හෙබ දක යන් මිතුර ''

(අ) මෙම පද්‍ය පාදය ඇතුළත් පද්‍ය ග්‍රන්ථයේ රචකයා නම් කරන්න.

(ආ) එතුමා විසින් රචිත වෙනත් කෘතියක නම ලියන්න.

(ix) ''කෙසේ වුවද මෙය මට ම තනිකර තබා ගැනීමට තරම් බර වැඩි අත්දැකීමක් විය ''

(අ) මෙම ගද්‍ය ඛණ්ඩය ඇතුළත් මුල් කෘතියේ නම ලියන්න.

(ආ) මෙහි බර වැඩි අත්දැකීම වූයේ කිනම් කරුණක් ද?

(x) පහත දැක්වෙන නිර්මාණකරුවන් හැඳින්වූ අන්වර්ථ නාම ලියන්න.

(අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

(ආ) එච්.එම්. කුඩලිගම

(ලකුණු 02×10 - 20 යි)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ගනේ මිණි බැබළි කිරණෙ 'ව් **සතපාය**
රනේ යට'ග සැවුලිඳු දද ගළපාය
අනේ ලකර කළ පුර අප **නරපාය**
පෙනේ දකුණු මහසෙන් දෙව් රද පාය

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි දෙවන පේළියේ අර්ථය ලියා දක්වන්න.

(ii) ''... එක් දවසක් අඟුල්මල් මහතෙරහු පෙරවරු පා සිවුරු ගෙනැ සැවැත් නුවර වැද <u>සපදන්සැරි</u> වන බැවින් ගෙපිළිවෙළින් කෙණෙසි අහර සිඟන්නාහු මූඪගර්භ වැ නො වැදිය හෙන <u>මාගමක</u> දැකැ කරුණායෙන් කම්පිත වූහු...''

(අ) අංකිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම සම්පූර්ණ පාඨයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iii) හෙට ඉදි වන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි

(අ) මෙහි ඇතුළත් කාව්‍යාලංකාරය නම් කරන්න.

(ආ) පද්‍ය පාදයේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

(iv) ''...ඒ දොළ දුන් මුදුන් පැමිණියේ ය. එබැවින් සත් දවසක් සැණකෙළි කෙළව යි නුවර බෙර ලවා තමන් වහන්සේ මාලිගයේ මතු මහලේ අමාත්‍ය මණ්ඩලය පිරිවරා හිඳ මහා සන්තෝෂයෙන් මත් වැ ජය පානය බොන සේක් යැයි'' කීහ.

(අ) මුදුන් පැමිණියා යැයි පැවසූ ඒ දොළ කුමක් ද?

(ආ) මෙහි 'තමන් වහන්සේ' යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?

(v) සැප සයනා සුවඳ බොජුන්
තුමුල මාලිගා
ඈ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ

(අ) මෙසේ ප්‍රශ්න කරන්නේ කවුරුන් ද?

(ආ) මෙය ශ්‍රවණය කළ අයගෙන් මීට ලැබුණු පිළිතුර කුමක් ද?

(ලකුණු 4 × 5 = 20 යි)

(03) (අ) සංවාදශීලි බස් වහරත්

(ආ) සංක්ෂිප්ත භාෂා ලක්ෂණත්

හේතුවෙන් 'අමාවතුර' ඉතා විශිෂ්ට ගණයේ නිර්මාණයක් ලෙස අගය කළ හැකි වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්,**

සැළලිහිණි සන්දේශය තත්කාලීන සමාජයේ ,

(අ) සමාජ හා ආර්ථික තොරතුරුත්

(ආ) දේශපාලන වශයෙන් පැවති තත්ත්වයත්

අනාවරණය කරන කාව්‍ය සංග්‍රහයකි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(04) (අ) තම උරුමය සොයා වෙහෙසෙන්නා වූත්,

(ආ) අධිෂ්ඨානශිලී වූත්,

තරුණයෙකු 'සිංහබාහු' නාට්‍යයේ සිංහබාහුගේ චරිතයෙන් මනාව පිළිබිඹු වේ.පෙළ පොතේ පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(අ) රට වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමත්

(ආ) තම චරිතය යහපත් ලෙස ගොඩනැගීමට අවශ්‍ය උපදෙස් ලබා දීමත්

හේතුවෙන් 'මුනි සිරිපා සිඹිමින්නේ' පද්‍ය පන්තිය සුවිශේෂී පද්‍ය පන්තියක් ලෙස අගය කළ හැකි වේ. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් තහවුරු කරන්න.

(ලකුණු 15 යි)

- 05, 06, 07 ප්‍රශ්නවලින් **එකකට** පමණක් පිළිතුරු ලියන්න.

(05) 'අතීතයේ කෘෂිකර්මාන්තයේ යෙදුණු ගැමියා මුහුණ දුන් විවිධ බාධක ජය ගැනීමට ඔහු දැරූ වෙහෙස කුරහන් කවි මගින් ප්‍රකාශ වේ.' අදාළ පාඩමෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(06) 'දියමන්ති මාලය කෙටිකතාවේ මැටිල්ඩාගේ චරිතය සජීවී ලෙස නිරූපණය කිරීමට කතුවරයා ගත් උත්සාහය සාර්ථක වී ඇත.' උදාහරණ තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න.

(07) 'ස්වභාව සෞන්දර්යයෙන් අනූන කැරගල ගම්පියස පිළිබඳ ව කියැවෙන කැරගල වැනුම සරල වූත් අව්‍යාජ වූත් පද්‍ය නිර්මාණයකි.' උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

: